# ආර්ථික ප්‍රතිසංස්කරණ දර්ශකය

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය | සෝෂල් ඉන්ඩිකේටර්
FRIEDRICH NAUMANN FOUNDATION FOR FREEDOM

2022 නොවැම්බර්

# හැඳින්වීම

මෙම දීප ව්‍යාප්ත සමීක්ෂණය ඔස්සේ වත්මන් ආර්ථිකය පිළිබඳ මහජන මතය සහ පසුගිය මාස කිහිපය තුළ සාකච්ඡා කළ ආර්ථික ප්‍රතිසංස්කරණ පිළිබඳව විමර්ශනය කරනු ලබයි. වික්‍රමසිංහ ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් මාස 48 ක කාලයක් සඳහා එක්සත් ජනපද ඩොලර් බිලියන 2.9 ක පමණ විස්තීර්ණ අරමුදල් පහසුකම් ලබා ගැනීමේ එකඟතාවයක් අපේක්ෂා කරනු ලබන්නේ, සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ තිරසාරබව ප්‍රතිෂ්ඨාපනය කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කිරීම, උද්ගතව ඇති උග්‍ර අවදානම් තත්ත්වයන් විසඳීම සඳහා පවතින සමාජ ආරක්ෂණ පද්ධති ශක්තිමත් කිරීම සහ රට පත්ව ඇති පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයට මුහුණ දීම සඳහා වර්ධන විභවයන් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවලට සහය වීමටයි. එනිසා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙතින් අවශ්‍ය සහය ලබා ගැනීමට උපකාර වන පියවර ගණනාවකට ප්‍රමුඛත්වය දීම රජය අරමුණු කරන නමුදු අනෙක් අතට, සුදුසු වගවීමේ ක්‍රියා පටිපාටියක් නොමැතිව අර්ථවත් සමාලෝචනයකින් තොරව එකී පියවර හඳුන්වා දීම තුළින් පුරවැසියන්ගෙන් බහුතරයකට එහි අහිතකර බලපෑම් ඇති කරයි. ජනාධිපති වික්‍රමසිංහගේ උපදෙස් පරිදි අඩු ආදායම්ලාභී පවුල් ඉලක්ක කර ගනිමින් සුබසාධන ප්‍රතිලාභ වැඩසටහන් දැනටමත් ආරම්භ කර තිබුණ ද, ශ්‍රී ලංකාවේ ආර්ථික හා දේශපාලන අර්බුදයට සහ නරක අතට හැරෙන ශ්‍රී ලාංකිකයන්ගේ ආර්ථික පීඩාවන්ට පිළිතුරු දීමට එය හිතකර ද සහ ප්‍රමාණවත් ද යන ප්‍රශ්නය තවමත් පවතී.

මෙම සමීක්ෂණය පවත්වන ලද්දේ, 1999 සිට ශ්‍රී ලංකාවේ පුළුල් පරාසයක සමාජ-දේශපාලනික ගැටළු පිළිබඳව මහජන මත විමසුම් පවත්වනු ලබන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි සමීක්ෂණ පර්යේෂණ අංශය වන  සෝෂල් ඉන්ඩිකේටර් (SI) විසිනි. සමීක්ෂණ පර්යේෂණ කණ්ඩායම ආචාර්ය ප්‍රදීප් පීරිස්, එම්. ක්‍රිෂ්ණමූර්ති, මුදිතා පතිරණ, ඉෂාරා ජයරත්න සහ අස්රා ෆායිස් යන අයගෙන් සමන්විත විය. මේ ආකාරයේ අධ්‍යයනයක් මෙරට තුළ සිදු කිරීම සඳහා ලබා දුන් සහයෝගයට අපි ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තුට සහ වුල්ෆ්ගැන්ග් හෙයින්ස් (Wolfgang Heinze) මහතාට සහ Friedrich Naumann Foundation for Freedom (FNF) ශ්‍රී ලංකාවේ කණ්ඩායමට ස්තූතිවන්ත වෙමු.

# ක්‍රමවේදය

ආර්ථික ප්‍රතිසංස්කරණ පිළිබඳ සමීක්ෂණය ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතරෙන් (සිංහල, දෙමළ, උඩරට දෙමළ සහ මුස්ලිම්) නියැදි ප්‍රතිචාර දැක්වූවන් 1000ක් සමඟ අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතයෙන් සිදු කරන ලදී. තවද, සියලුම දිස්ත්‍රික්ක 25 තුළ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල ස්ත්‍රීන් සහ පුරුෂයන්ගෙන් එකී නියැදිය සමන්විත විය. ක්ෂේත්‍ර කටයුතු සඳහා ක්ෂේත්‍ර සමීක්ෂකයන් 73ක් (ස්ත්‍රී සහ පුරුෂ) සහභාගී විය. මෙම ප්‍රතිචාර දැක්වූවන් අහඹු නියැදි ක්‍රමවේදය භාවිතා කරමින් තෝරා ගන්නා ලද අතර, නියැදි ස්ථාන තෝරා ගැනීම සඳහා බහු-අදියර අහඹු ස්ථර නියැදි තාක්ෂණය භාවිතා කරන ලදී. මෙම ජාතික මත විමසුම සඳහා ක්ෂේත්‍ර කටයුතු 2022 ඔක්තෝම්බර් 21 දින සිට 31 දින දක්වා පවත්වන ලදී. ජනගහනයේ සැබෑ දිස්ත්‍රික්කය සහ ජනවාර්ගික අනුපාතය පිළිබිඹු කිරීම සඳහා දත්ත කට්ටලය බර තබා ඇත. සමාජ විද්‍යාව සඳහා සංඛ්‍යාන පැකේජය (SPSS) භාවිතයෙන් දත්ත කට්ටලය විශ්ලේෂණය කරන ලදී.

# විධායක සාරාංශය

### ආර්ථික තත්ත්වය වසරකට පෙර පැවති තත්වය සමග සැසඳීම

- ශ්‍රී ලාංකිකයන්ගෙන් අතිමහත් බහුතරයක් (79%) පවසන්නේ තම ආර්ථික තත්ත්වය වසරකට පෙර පැවති තත්ත්වයට වඩා නරක අතට හැරී ඇති බවයි. විවිධ වෘත්තීන්හි යෙදී සිටින ශ්‍රී ලාංකිකයන් විසින් මෙම මතය දරනු ලබයි. නරක අතට හැරුණු ආර්ථික තත්ත්වයන් ප්‍රධාන රැකියා අංශ තුළින් පැහැදිලි වේ. විශේෂයෙන්ම ස්වයං රැකියාවල නියුතු අයගේ (90%) සහ පෞද්ගලික අංශයේ රැකියාවල නියුතු අයගේ (83%) ආර්ථික බර අනෙකුත් අංශවල අයට වඩා සංසන්දනාත්මකව තරමක් වැඩි වේ.

### ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සහය පිළිබඳ මහජන මතය

- රටේ ආර්ථික අර්බුදයෙන් මිදීම සඳහා රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත ප්‍රවේශය වීම ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් (61%) අනුමත කරති.
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෙන් ශ්‍රී ලංකාවට වත්මන් ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට හැකි වනු ඇති බව ශ්‍රී ලාංකිකයන්ගෙන් හතරෙන් තුනක් (75%) විශ්වාස කරනු ලබයි. මෙහිදී සැලකිය යුතු කරුණක් නම්, ශ්‍රී ලාංකිකයන්ගෙන් පහෙන් එකක් මෙම ප්‍රවේශය පිළිබඳව ඉතා සුබවාදී අදහස් දරයි.

### එක්සත් ජාතීන්ගේ යෝජනාව පිළිබඳ දැනුවත්භාවය සහ මහජන මතය

- ජිනීවාහි දී 2022 ඔක්තෝම්බර් 06 දින ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සම්මත වූ එක්සත් ජාතීන්ගේ යෝජනාව පිළිබඳ තමන් දැනුවත් බව ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් (46%) ප්‍රකාශ කරයි.
- මෙම යෝජනාව මගින් දැනට පවතින ආර්ථික අර්බුදයට විසඳුම් ලබා දෙන ලෙස ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටින බවට තමන් දැනුවත් බව ඔවුන් අතරින් බහුතරයක් (76%) විසින් ප්‍රකාශ කරනු ලබයි.

### යෝජිත දේශීය ආදායම් සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ දැනුවත්භාවය සහ ඒ පිළිබඳ මහජන මතය

- රජය විසින් යෝජනා කර ඇති දේශීය ආදායම් සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳව ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයකට මඳක් වැඩි (54%) ප්‍රමාණයකට දැනුවත්භාවයක් ඇත. මෙසේ දැනුවත්භාවයක් ඇතැයි ප්‍රකාශ කරන පිරිසෙන් 64% ක් එය අනුමත නොකරයි.

### ආර්ථික ප්‍රතිසංස්කරණ මෙහෙය වන පුද්ගලයන් පිළිබඳ මහජන විශ්වාසය

- මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල වලින් පැහැදිලි වන්නේ ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් වත්මන් ආර්ථික අර්බුදය විසඳීම සම්බන්ධයෙන් නිවැරදි තීන්දු තීරණ ගැනීවී යැයි මහ බැංකු අධිපති (57%) ආචාර්ය නන්දලාල් වීරසිංහ කෙරෙහි විශ්වාසය තබන බවයි.

- මහජන විශ්වාසය දෙවනුව තබා ඇත්තේ මුදල් අමාත්‍ය රනිල් වික්‍රමසිංහ (45%) කෙරෙහි වන අතර, තුන්වැන්නා ලෙස රාජ්‍ය මූල්‍ය කමිටුවේ (COPF) සභාපති ආචාර්ය හර්ෂ ද සිල්වා (43%) කෙරෙහි ශ්‍රී ලාංකිකයන් ස්වකීය විශ්වාසය තබා ඇත.
- ශ්‍රී ලාංකිකයන්ගෙන් හතරෙන් එකක් (25%) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE) සභාපති මහාචාර්ය රංජිත් බණ්ඩාර කෙරෙහි විශ්වාසය තබයි.
- ආර්ථික ස්ථාවරත්වයට අදාළ කෙටි හා මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනාගැනීමේ ජාතික සභා අනුකමිටුවේ සභාපති පාඨලී චම්පික රණවක කෙරෙහි (23%) අවම විශ්වාසයක් තබා ඇත.

**ආර්ථික අර්බුදයට ජාත්‍යන්තර සහය**

- ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ශ්‍රී ලංකාවට සහාය වනු ඇතැයි මහජනතාව සිතන්නේ කුමන රටදැයි විමසා බැලීමේදී ශ්‍රී ලාංකිකයන් ඉහළින්ම ආසියාතික රටවල් ශ්‍රේණිගත කරයි.
- ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ශ්‍රී ලංකාවට චීනය සහාය වනු ඇතැයි බොහෝ ශ්‍රී ලාංකිකයන් (37%) විශ්වාස කරති. ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ශ්‍රී ලංකාවට ඉන්දියාව සහාය දෙන බව ශ්‍රී ලාංකිකයන්ගෙන් හතරෙන් එකක් පමණ (24%) ද ජපානය ශ්‍රී ලංකාවට සහාය දෙන බව 14% ක් ද විශ්වාස කරති.
- ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ශ්‍රී ලංකාවට ඇමරිකා එක්සත් ජනපදය හෝ යුරෝපීය රටවල් සහය දෙනු ඇති බව සිතන්නේ ශ්‍රී ලාංකිකයන්ගෙන් 10% කට අඩු පිරිසකි.

**ශ්‍රී ලාංකිකයන් අත්විඳින ආර්ථික දුෂ්කරතා**

- සමීක්ෂණ ප්‍රතිඵල වලින් හෙළිවන්නේ ශ්‍රී ලාංකිකයන්ගේ ආර්ථික දුෂ්කරතා තවදුරටත් පවතින බවයි. ආර්ථික අර්බුදයෙන් ඇති වූ ප්‍රතිඵලයක් ලෙස ආහාර ද්‍රව්‍යවල ගුණාත්මකභාවය වෙනස් කිරීම / මිලදී ගැනීමට හුරුවී සිටි ආහාර ද්‍රව්‍ය නොගෙන වෙනත් දේ මිලදී ගැනීම සිදු කර ඇති බව 82% ක් පෙන්වා දෙයි. තවද, ඖෂධ හෝ වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමේ දුෂ්කරතා අත්විඳින බව 66% ක් සහ තම දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වන වියදම් අඩු කර ඇති බව 37% ක් ප්‍රකාශ කරයි. සෑම තිදෙනෙකුගෙන් එක් අයෙකු (35%) ප්‍රකාශ කරන්නේ ඔවුන් දිනකට ගන්නා ආහාර වේල් ප්‍රමාණය හෝ ලබාගන්නා වේල් ගණන අඩු කර ඇති බව සහ 31% ක් පමණ ප්‍රකාශ කරන්නේ තමන්ට හෝ තමන්ගේ පවුලේ සමාජිකයකුට රැකියාවක් අහිමි වී ඇති බවයි.

**විදේශගත වීමට ඇති කැමැත්ත**

- ශ්‍රී ලාංකිකයන්ගෙන් 60% කට ආසන්න ප්‍රමාණයක් ප්‍රකාශ කරන්නේ තමන්ට අවස්ථාවක් ලැබුණහොත් විදෙස්ගත වීම පිළිබඳ සලකා බලන බවයි. මෙයින් බහුතරයක් තරුණ තරුණියන්ය. මෙම සමීක්ෂණයෙන් හෙළිවන්නේ අවස්ථාවක් ලැබුණොත් විදෙස්ගත වීමට වැඩි කැමැත්තක් දක්වන්නේ සිංහල තරුණ තරුණියන් බවයි. ඔවුන් විදෙස්ගත වීමට කැමති රටවල් සම්බන්ධයෙන් විමසූ විට, බහුතරයක් නැගෙනහිර ආසියාතික රටවලට, ප්‍රධාන වශයෙන් ජපානය සහ දකුණු කොරියාවට යාමට කැමැත්තක් දක්වයි. වැඩිම කැමැති ගමනාන්තය ලෙස දෙවනුව යුරෝපීය රටවල් තෝරාගෙන ඇත.

## ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති කෙරෙහි ආකල්ප

- සමීක්ෂණ ප්‍රතිඵල වලින් පැහැදිලි වන්නේ ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් (56%) විදේශීය සමාගම්වලට රට තුළ ආයෝජනය කිරීමට රජය විසින් ඉඩ දිය යුතු බවට විශ්වාස කරන බවයි. රජය පුද්ගලයෙකුගේ ඉපැයීමේ හැකියාව සීමා නොකළ යුතු බව 65% ට ආසන්න ප්‍රමාණයක් විශ්වාස කරන අතර ව්‍යාපාර පවත්වාගෙන යාම රජයේ වගකීමක් නොවන බැවින් රජයේ සංස්ථා පෞද්ගලීකරණය කළ යුතු බව 34% ක් ප්‍රකාශ කරයි.

## සුබසාධන ප්‍රතිපත්ති පිළිබඳ මහජන මතය

- සුබසාධන ප්‍රතිපත්ති පිළිබඳ විමසූ ප්‍රශ්නයේදී ජනතාව මිශ්‍ර අදහස් ප්‍රකාශ කරන ලදී. රජයේ සේවක සංඛ්‍යාව අඩු කිරීමට බහුතරයක් සහය පළ කළ නමුත්, සුබසාධන වැඩසටහන් සඳහා වියදම් කිරීමට රජය වගකීමෙන් කටයුතු කරනු ඇතැයි ද මහජනයා අපේක්ෂා කරති.
- සෑම පුරවැසියෙකුටම රැකියාවක් ඇති බව සහතික කිරීම රජයේ වගකීමක් යන්න පිළිබඳව මහජනතාව මිශ්‍ර අදහස් පළ කරති. තරුණ තරුණියන් මෙන්ම වැඩිහිටියන් ද (අවුරුදු 30ට වැඩි) රජයේ සේවක සංඛ්‍යාව අඩුකිරීමේ යෝජනාව සහ පුරවැසියන්ට සුබසාධනය සැපයීමේ වගකීම රජය භාරගත යුතුය යන කාරණා සම්බන්ධයෙන් එකම මතයක් දරයි.
- කෙසේ වුවත්, රැකියාවක් සොයා ගැනීම පුද්ගලයාගේ වගකීමක් මිස රජයේ වගකීමක් නොවන බවට වන අදහසට වැඩි සහයක් දක්වා ඇත්තේ තරුණ තරුණියන්ය.

## අනාගත ආර්ථික තත්ත්වය පිළිබඳ ශුභවාදීත්වය සහ අශුභවාදීත්වය

- සමීක්ෂණ ප්‍රතිඵල වලට අනුව, ශ්‍රී ලාංකිකයන්ගෙන් 41% ක් ශ්‍රී ලංකාවේ ආර්ථික අනාගතය කෙරෙහි ඔවුන්ගේ අශුභවාදීත්වය ප්‍රකාශ කරයි. විශේෂයෙන් අවුරුදු 30 සහ ඊට වැඩි වයස් සීමාවේ සිටින පුද්ගලයන් රටේ ආර්ථික අනාගතය කෙරෙහි ඉහළ අශුභවාදීත්වයක් ප්‍රකාශ කරති. රටේ ආර්ථික අනාගතය පිළිබඳව සාපේක්ෂව ඉහළ මට්ටමේ අශුභවාදීත්වයක් දරන්නේ ස්වයං රැකියාවල සහ පෞද්ගලික අංශයේ නියුතු අයයි. ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය වසරකින් හොඳ අතට හැරේ යැයි විශ්වාස කරන්නේ 18%ක් පමණි.

1958 දී ජර්මන් ජනරජයේ ප්‍රථම ජනාධිපති තියඩෝර් හියුස් විසින් Friedrich Naumann Foundation for Freedom පිහිටුවන ලදී. මෙම සංවිධානයේ අරමුණ වන්නේ ජර්මනියේ සහ විදේශයන්හි සිටින සියලුම මිනිසුන්ගේ සහ සමාජයේ සෑම අංශයකම ගෞරවය සඳහා නිදහසේ මූලධර්මය සහතික කිරීමේ ඉලක්කය ප්‍රවර්ධනය කිරීමයි. අපගේ වැඩ කටයුතු සඳහා අරමුදල් සපයනු ලබන්නේ ෆෙඩරල් ආර්ථික සහයෝගිතා සහ සංවර්ධන අමාත්‍යාංශය හරහා ජර්මානු පාර්ලිමේන්තුව, විදේශ කාර්යාලය සහ වැඩි වශයෙන් යුරෝපීය සංගමය මඟිනි. Friedrich Naumann Foundation for Freedom ලොව පුරා රටවල් 60කට අධික සංඛ්‍යාවක ක්‍රියා කරයි. දකුණු ආසියාවේත ඉන්දියාව, පකිස්ථානය, බංගලාදේශය සහ ශ්‍රී ලංකාවේ FNF කාර්යාල ඇත. මීට අමතරව නේපාලය, භූතානය සහ මාලදිවයිනේ හවුල්කරුවන් සමඟ කටයුතු කරයි. Friedrich Naumann Foundation for Freedom සංවිධානය  ශ්‍රී ලංකාව සමඟ ඇති සම්බන්ධය දශක පහක් පැරණි ය. 1968 සිට 2013 දක්වා කාලය තුළ සහ 2016 දී එහි වැඩ කටයුතු නැවත ආරම්භ කිරීමෙන් පසු සංවිධානයේ කාර්යය මගින් නිදහස සහ වගකීම පිළිබඳ මූලික වටිනාකම් කෙරෙහි ස්වකීය අවධානය යොමු කරයි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවි දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයක් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

ලිපිනය: නො. 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව.
දුරකථන: +94 11 208134/ +94 11 208135/ +94 11 208136
ෆැක්ස්: +94 11 208138
වෙබ්: www.cpalanka.org
විද්‍යුත් තැපෑල: info@cpalanka.org

සෝෂල් ඉන්ඩිකේටර් යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි (CPA) සමීක්ෂණ පර්යේෂණ ඒකකය වන අතර එය වර්ෂ 1999 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කෙරුණි. එමඟින් සමාජ හා දේශපාලන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථිර, වෘත්තීය සහ ස්වාධීන සමීක්ෂණ මධ්‍යස්ථානයක් සඳහා දීර්ඝ කාලීනව පැවැති රික්තකයක් පුරවා ඇත. මත විමසීම් හරහා අදහස් ප්‍රකාශ කිරීම ප්‍රජාතන්ත්‍රවාදය සවිබල ගැන්වීමේ මෙවලමක්ය යන දැඩි විශ්වාසයෙන් යුක්තව සෝෂල් ඉන්ඩිකේටර් ආරම්භයේ සිටම සමාජ-ආර්ථික හා දේශපාලන ගැටළු රාශියක් පිළිබඳව මත විමසීම් පවත්වනු ලබයි.

ලිපිනය: නො. 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව.
දුරකථන: +94 11 2584050
වෙබ්: www.cpalanka.org.survey-research
විද්‍යුත් තැපෑල: krishna@cpasocialindicator.org